# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2456/05 – 2025 සැප්තැම්බර් මස 29 වැනි සඳුදා – 2025.09.29**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පන්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලෙගම්පහ පලිස්පත්තු බටහිර කෝරළේ සුළු කොට්ඨාසයේ, බැද්දේගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Maha/PNW/2013/1277-B හා 2013.07.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර A – බටගල ඩිවිෂන් - ප්‍රමාණය: හෙක්. **9.3077**

උතුරට: ඇළ සහ රජයට අයත් බටගල ඩිවිෂන්; නැගෙනහිරට: රජයට අයත් බටගල ඩිවිෂන් සහ ඇළ; දකුණට: ඇළ, මාර්ගය සහ රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් බටගල ඩිවිෂන්; බටහිරට: රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් බටගල ඩිවිෂන් සහ ඇළ.

කේ. ඩී. ලාල් කාන්ත,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 13/97/FR/330.
2025 ජූලි මස 23 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 09 – 0244

1A – G 45448– 24 (2025/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*